# මුල් ළමා විය අධ්‍යාපන හා සුරැකුම් මධ්‍යස්ථානය *(ECEC)* වෙත සාදරයෙන් පිළිගනිමු



දෙමාපියන් ලෙස, ඔබ රාජකාරියේ හෝ අධ්‍යාපනයේ නිරත වන අතරේ ඔබේ දරුවාව සුරක්ෂිත ලෙස ECEC මධ්‍යස්ථානයේ රඳවා තැබිය හැක. පුහුණුව ලත් කාර්ය මණ්ඩලයක් කළ හැකි විශිෂ්ටතම ආකාරයෙන් ඔබේ දරුවාව රැක බලා ගනියි. දරුවන්ට ඔවුන්ගේ වයස අනුව සංවර්ධනය වීමට හා වැඩීමට හැකි වන පරිදි මෙහි පරිසරය දරුවන්ගේ අවශ්‍යතාවලට අනුව හැඩ ගස්වා ඇත.

## දරුවකු ***ECEC*** මධ්‍යස්ථානයට මුලින් පැමිණීමේ දී

දරුවකු මුල් ළමාවිය අධ්‍යාපන හා සුරැකුම් මධ්‍යස්ථානයට ප්‍රථම වරට ඇතුළත් වීමේ දී නව පරිසරය තුළ හඳුන්වාදීමේ ඉගෙනුම් සැසියක් පැවැත්වීම සඳහා දරුවා දෙමාපියන්ගෙන් අයෙකු හෝ දෙදෙනාම සමග දිවා සුරැකුම් මධ්‍යස්ථානය වෙත පැමිණීම වැදගත් වේ.

මෙම හඳුන්වාදීමේ සැසිය අතරතුර, දෙමාපියන් මෙන්ම දරුවා යන දෙ පාර්ශ්වයටම කාර්ය මණ්ඩලය කටයුතු කරන ආකාරය සහ දරුවාගේ අවශ්‍යතා අනුව පරිසරය හැඩ ගස්වා ගන්නා අයුරු නිරීක්ෂණය කිරීමට අවස්ථාව ලැබේ. දරුවාට එහි සිටීම ආරක්ෂිත බව දැනී, ඊට සතුටු වූ විට දෙමාපියන්ට දරුවා මධ්‍යස්ථානයෙහි රඳවා තබා යා හැක. දරුවා හා සම්බන්ධ විවිධ ගැටලු සාකච්ඡා කිරීම හා මධ්‍යස්ථානය පිළිබඳ වඩා හොඳ අවබෝධයක් ලබා ගැනීම සැම විටම දිරි ගන්වනු ලැබේ. කාර්ය මණ්ඩලය රහස්‍යභාවය ආරක්ෂා කිරීමට බැඳී සිටී.

මනා හඳුන්වාදීමේ කාල සීමාවකට සාමාන්‍යයෙන් දින 5 දිට 10 අතර දක්වා කාලයක් ගත වේ. කාර්ය මණ්ඩලය සමග සාකච්ඡා කර පැමිණීමේ කාලය පිළිබඳ එකඟතාවයකට පැමිණෙන්න! හඳුන්වාදීමේ කාලය සඳහා ගාස්තු අය නොකෙරේ.



## දරුවා මධ්‍යස්ථානයේ රඳවා යෑමේ දී ප්‍රයෝජනවත් වන උපදෙස්

- සැමවිටම දරුවාව කාර්ය මණ්ඩලයේ සාමාජිකයකු වෙතම භාර දෙන්න
- දිගු වේලාවක් රැඳී නොසිට, දරුවාව ආරක්ෂිත ලෙස කාර්ය මණ්ඩල සාමාජිකයකු වෙත භාර දුන් සැණින් පිට වී යන්න.
- “බායි”, “මං යනවා”, “ගිහින් එන්නම්”, “සතුටින් ඉන්න” වැනි යමක් පිට වී යාමට ප්‍රථම දරුවාට පවසන්න.
- දරුවා තරමක් හැඬුව ද ඒ පිළිබඳ කලබල නොවන්න. එය ඉක්මනින්ම පහව යනු ඇත.



## **ECEC** මධ්‍යස්ථානයේ මූලික හර පද්ධතීන්

සුරක්ෂිතභාවය

- දරුවාට හොඳම දෑ කවරේ ද
- ළමාවිය සුරක්ෂිත කිරීම
- සමාජයීය ප්‍රජාව

දරුවාගේ නෛසර්ගික වටිනාකම

- අනන්‍ය හා අනර්ඝ
- සමානාත්මතාව
- විවිධත්වය



වෘත්තීයභාවය

- මාර්ගෝපදේශනය
- සංවේදී බව
- ප්‍රතිචාර දැක්වීම

සෞඛ්‍ය සම්පන්න හා තිරසාර ජීවන රටාව

- කාබනික චින්තනය
- ආහාර - විවේකය - ක්‍රියාකාරකම්

ගෞරවය

- සැලකිල්ල
- රැකවරණය

### දරුවෝ සෙල්ලම් කිරීමෙන් ඉගෙන ගනිති

සෙල්ලම් කිරීම සියලුම ළමයින්ට වැදගත්ය. ක්‍රීඩා මගින් ඔවුන්ගේ සිතීමේ හැකියාව, පරිකල්පන ශක්තිය, උපදෙස් දීමට හා ලැබීමට ඇති හැකියාව හා සහයෝගීත්ව කුසලතා දියුණු කරයි.

### චාලක නිපුණතා

දරුවාගේ චාලක කුසලතා දිනපතා සිදු කෙරේ. ක්‍රීඩා කිරීමේ දී, කැපීමේ දී, යමක් ගොඩ නැඟීමේ දී, චිත්‍ර ඇඳීමේ දී අත්වැඩ ආදිය සිදු කිරීමේ දී සියුම් චාලක නිපුණතා වර්ධනය වේ. දිවීමේ දී, නැඟීමේ දී හා වැලි හැරීම වැනි ක්‍රියා සිදු කිරීමේ දී දළ චාලක නිපුණතා වර්ධනය වේ.


### ස්වභාව ධර්මය

දරුවාට සෘතු භේදය, ගහකොළ හා සතුන් පිළිබඳ ඉගෙනීමට අවස්ථාවක් ලැබෙන ස්වභාව ධර්මයට සමීප පරිසරයක අපි කාලය ගත කරමු. ස්වභාව ධර්මය තුළ ලබන අත්දැකීම් දරුවාගේ සෞඛ්‍යය හා ශාරීරික යෝග්‍යතාවයට යහපත් වන අතර ඔවුන්ට සිය පරිකල්පන හැකියාව උරගා බැලීමට අවස්ථාවක් ලබා දේ.

### භාෂා පුහුණුව

දරුවාගේ වාග්කෝෂය සහ අදහස් ප්‍රකාශ කිරීමේ හැකියාව වර්ධනය කර ගැනීම සඳහා අපි දරුවන්ට විශාල පුහුණුවක් ලබා දෙන්නෙමු. අපි සුරංගනා කථා, කවි ගීත ආදිය කියවන අතර විවිධ භාෂාව හා බැඳුණු ක්‍රීඩා සිදු කරන්නෙමු. දරුවාගේ වාග්කෝෂය හා භාෂා අවබෝධය දියුණු කිරීමේ ක්‍රමයක් වනුයේ ඔවුන් සමග දිනපතා කතා කිරීමයි .

## සුරැකුම් වේලාවන්




සාමාන්‍යයෙන් දරුවාගේ සුරැකුම් කාලය තීරණය වනුයේ මව්පියන් රාජකාරිවල යෙදෙන කාලය මත පදනම්වය. ඔබට පවුලේ අවශ්‍යතාවන්ට අනුව මසකට යම් පැය ගණනක් වෙන් කර ගත හැක. දරුවාගේ සුරැකුම් වේලාවන් Päikky නම් පරිගණක වැඩසටහනෙහි වෙන් කරනු ලැබේ. මධ්‍යස්ථානයෙන් තොරතුරු ලබා ගැනේ.

දරුවා සුරැකුම් මධ්‍යස්ථානයෙහි රඳවා තැබීමට ගිවිසගත් වේලාවන් ඒ අයුරින්ම අනුගමනය කළ යුතු වේ! දරුවා රැගෙන යාමට දෙමාපියන් හැර වෙන අයෙකු පැමිණෙන්නේ නම් ඒ බව සැමවිටම මධ්‍යස්ථානයට කලින් දැනුම් දෙන්න. දරුවා සුරැකුම් මධ්‍යස්ථානය වෙත රැගෙන විත් භාර දිය හැක්කේ වැඩිහිටියන්ට පමණි

## ආහාර හා විශේෂ කෑම බීම


සුරැකුම් දිනය තුළ එදිනෙදා කටයුතුවලට සම්බන්ධ වීමට හා මනා ජවයකින් සිටීමට ළාබාල දරුවන්ට ආහාර අවශ්‍ය වේ. දිනය තුළ, උදෑසන ආහාර, දිවා ආහාරය හා කෙටි ආහාර මධ්‍යස්ථානයෙන් සපයනු ලැබේ. කරුණාකර, ඔබේ දරුවාට යම් ආහාර අසාත්මිකතාවක් වේ නම් එය මධ්‍යස්ථානයට දන්වන්න. එවැනි අවස්ථාවක දී වෛද්‍ය සහතිකයක් අවශ්‍ය වේ!



# ඇඳුම්



කාලගුණය කුමක් වුවත් අපි සැමදිනම එළිමහනේ ඇවිදින්නෙමු! දරුවාට පහසු ඇඳුම් අන්දවා තිබිය යුතු අතර අමතර ඇඳුම් කට්ටලයක් තිබිය යුතුය. දරුවාට ශීතලය නොදැනෙන පරිදි උණුසුම්ව අන්දවා තිබිය යුතුය. නැවුම් වාතය දරුවාගේ සෞඛ්‍යයට හිතකර අතර ඔවුන් සෞඛ්‍ය සම්පන්නව තැබීමට උපකාරී වේ.

වැසි දින සඳහා දරුවාට වැසි ආවරණ කබා හා රබර් බූට් සපත්තු තිබිය යුතුය!






ශීත ඍතුව සඳහා උණුසුම් ඇඳුම්: ඕවරෝල්, තොප්පි හා අත් වැසුම්!

කරුණාකර ඇඳුම්වල හා සපත්තුවල දරුවාගේ නම ගසන්න.



ග්‍රීෂ්ම ඍතුවට මෙන්ම ශීත ඍතුවට ද එළිමහනේ ඇවිදීමට සුදුසු පාවහන් තිබිය යුතුය.




## රෝගී දරුවන්

දරුවා අසනීපයෙන් පසු වන්නේ නම්, සැමවිටම මධ්‍යස්ථානයට හෝ කාර්ය මණ්ඩලයට දන්වන්න. දරුවා අසනීපයෙන් පසු වන්නේ නම්, එක් අතකට අනෙක් ළමුන්ට රෝගය බෝ වීම වළක්වා ගැනීමට හා අනෙක් අතට දරුවාට ක්‍රියාකාරකම්වල යෙදීමේ හැකියාවක් නොමැති බැවින්, එබඳු විටක දරුවා නිවසේ රඳවා ගත යුතුය.

- දරුවාට උණ රෝගය වැළඳී තිබේ නම්, ඔහු සම්පූර්ණ දිනයක් පුරාවට උණ නොසෑදී තිබෙන තෙක් නිවසේ රඳවා ගත යුතුයි!
- උදරාබාධ හෝ පාචනය වැළඳීමෙන් පසු දරුවා අවසන් වරට වමනය දමා හෝ පාචනය ඇති වී අවම වශයෙන් පැය 48ක් ගත වන තුරු නිවසේ රඳවා ගත යුතුයි.

**ECEC** මධ්‍යස්ථානයෙහි ගාස්තු **ECEC** තුළ සේවායෝජකයින්ගේ ගාස්තුවලට අදාළ නීති ප්‍රකාරව දෙමාපියන්ගේ දළ ආදායම හා පවුලේ සාමාජිකයින් ගණන මත පදනම් වේ.

- සම්පූර්ණ මාසය සඳහා ගාස්තුව නගර සභාවට ඉන්වොයිස් කරනු ලැබේ.
- ඔබ ආදායම පිළිබඳ තොරතුරු ඉදිරිපත් නොකරන්නේ නම්, ස්වයංක්‍රීයව උපරිම ගාස්තුව අය කරනු ලැබෙනු ඇත.
- ගාස්තුවලට අදාළ ප්‍රශ්න සඳහා පිළිතුරු නගර සභාවෙන් ලබා ගත හැක.

## පාර්ශ්වකරුවෝ

ECEC මධ්‍යස්ථානය තුළ අපි විශේෂ පෙර පාසැල් ගුරුවරු, උපදේශකවරු, සමාජ හා සෞඛ්‍ය සේවා කාර්ය මණ්ඩල, මනෝ විද්‍යාඥයින් හා අවශ්‍ය අවස්ථාවන්හි විවිධ චිකිත්සකයින් සමග අපි කටයුතු කරන්නෙමු. දරුවාගේ භාරකරුවන් සමග වන පහත ගිවිසුම ප්‍රකාරව මෙය සිදු කෙරේ.ෙ

